**ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය - 2021**

**----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශය, සමුච්චිත අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංගමයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සම්මේලනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සම්මේලනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සම්මේලනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සම්මේලනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය**

**---------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සම්මේලනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සම්මේලනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සම්මේලනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සම්මේලනයේ ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශ අනුව සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය වෙත 2021 දෙසැම්බර් 31 දිනට රු 987,449 ක් ගෙවිය යුතු වුවද අධිකාරිය විසින් ලබා දුන් ශේෂ සනාථන අනුව එය රු.3,176,662 ක් වූයෙන් රු.2,189,213 ක වෙනසක් නිරීක්ෂණය විය. එම වෙනසට හේතු සොයාබලා මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට සම්මේලනය විසින් කටයුතු කර නොතිබුණි. | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය වෙත ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු හා අදාළ වෙනස සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | ගෙවිය යුතු ශේෂවල නිවැරදිතාවය පරීක්ෂා කර බලා සනාථ වන තොරතුරු අනුව එම ශේෂ නිවැරදිව ගලපා මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) ඉකුත් වර්ෂයේදී පාසල් වොලිබෝල් තරඟාවලි වියදම් පියවා ගැනීම සඳහා අනුග්‍රාහක ආයතනයක් වෙතින් ලැබී තිබුණු රු.මිලියන 5.8 ක දායකත්වය එම තරඟාවලිය නොපැවැත්වීම නිසා උපචිත වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීමේ ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී උපචිත වියදමින් අඩුකර ඉකුත් වර්ෂයේ සමුච්චිත අතිරික්තයට එකතු කර තිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂයේ ඉදිරියට ගෙනවිත් තිබුණු සමුච්චිත අතිරික්ත ශේෂය රු.මිලියන 5.8 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල පැවතුණි. එසේම 2022 වර්ෂයේ පැවැත්වීමට නියමිත ඉහත තරඟාවලිය සඳහා මෙකී පරිත්‍යාග මුදලින් දැරිය යුතු වියදම් සඳහා වන වගකීම මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය වී නොතිබුණි. | 2020 වර්ෂයේ DSI වොලිබෝල් තරඟාවලිය පැවැත්වීමට Covid 19 හේතුකොට ගෙන කටයුතු කර නොතිබූ අතර අදාල වර්ෂයේ ආදායමට නොගැනීම පිළිබඳ විගණන විමසුම් යොමු වූ බැවින් 2021 වර්ෂයේදී ගිණුම් සඳහා පෙර වර්ෂ ගැලපීමක් වශයෙන් ගිණුම්ගත කර තිබූ අතර 2022 වර්ෂයේදී ජූනි හා අගෝස්තු මස තරඟාවලිය පැවැත්වීම සඳහා කටයුතු සැලසුම් කර අයදුම් පත්‍ර කැඳවා තිබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කල යුතු වීම |

### 1.5.2 ගෙවිය යුතු ගිණුම්

--------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සම්මේලනය විසින් වර්ෂ 08 ක කාලයක සිට ශ්‍රී ලංකා රූපවාහිනි | ඉදිරි වර්ෂ වලදී නිරවුල් කිරීමට කටයුතු කරමි. | ගෙවිය යුතු මුදල් අප්‍රමාදව නිරවුල් කල |

| | | |
|---|---|---|
| සංස්ථාවට සහ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයට ගෙවිය යුතු පිළිවෙළින් රු.2,000,000 ක් සහ රු.987,449 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | | යුතු වීම. |
| (ආ) වර්ෂයක සිට වර්ෂ හතරක කාලයකට අදාළව ගෙවිය යුතු රු.227,709 ක් වූ විගණන ගාස්තු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | විගණන ගාස්තු නිරවුල් කිරීමට කටයුතු කරමි. | - එම - |

## 2. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.4,862,514 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,332,106 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,530,408 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආදායම රු.46,346,632 කින් වැඩිවීම හා ඊට සාපේක්ෂව වියදම රු.48,877,040 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ සමුච්චිත අරමුදල වර්ෂ 04 ක කාලය තුල රු.7,211,274 කින් පරිහානියට පත්ව තිබුනු අතර මුළු වත්කම් සමග සැසඳීමේදී සමුච්චිත අරමුදලේ සෘන ශේෂය සියයට 116 ක් විය. තවද සම්මේලනය 2020 හා 2021වර්ෂ වල ජංගම අනුපාතය පිරිහීමකට ලක්ව තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් 1 කට ජංගම වගකීම් 15.9 ක් ලෙස ද්‍රවශීලතාවයට අහිතකර ලෙස පැවතුණි. එය සම්මේලනයේ පැවැත්ම කෙරෙහි දැඩිලෙස බලපානු ඇති බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පාලක මණ්ඩලය ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි. | ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ ද්‍රව්‍යශීලීතාවය කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීමට විධායක සභාවේදී කටයුතු කර තිබේ. | සංගමයේ මූල්‍ය කාර්යසාධනය සහ ද්‍රවශීලතාවය කෙරෙහි කළමණාකරන මණ්ඩලය විශේෂ අවධානය යොමු කල යුතු වීම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග 7 (xi) ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. | 2020 වර්ෂයේදී සංයුක්ත සැලැස්මක් සකස් කිරීමට අවධානය යොමු කර තිබේ. | ජාතික ක්‍රීඩා සංගම් නියෝග අනුව සංයුක්ත සැලැස්මක් අප්‍රමාදව පිළියෙල කල යුතු වීම. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ සම්මේලනයේ කටයුතු සම්බන්ධ අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව පාලක මණ්ඩලය විසින් අවධානය යොමුකර නොතිබුණි | අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක නොවන අතර මාසිකව පවත්වන විධායක සභාවේදී මාසික මූල්‍ය වාර්තාව ඉදිරිපත් කර අනුමැතිය ලබා ගන්නා අතර වෙනම අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට විධායක සභාවේ අවධානය යොමු කරමි. | සම්මේලනයේ කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කල යුතු වීම. |